# 2.21 පුවත්පතේ සමාජ වගකීම සහ ප්‍රවෘත්ති වාර්තාකරණය.

සමන් රාජපක්ෂ, ජනසන්නිවේදන අධ්‍යයන අංශය.
කැලණිය විශ්වවිද්‍යාලය.

## ABSRACT

ප්‍රබල ජන මාධ්‍යයක් වන පුවත්පත ලාංකීය සමාජ දේහය විවිධාකාරයෙන් පෝෂණය කරමින් සිටී. මෙහිදී පුවත්පත සතු සමාජ වගකීම යන්නට ප්‍රධාන තැනක් හිමි වේ. එහෙත් පුවත්පත සතු සමාජ බලපෑම් කාරී ස්වභාවය හෝ පුවත්පතේ සමාජ වගකීම යන්න අද වන විට නිශ්චිතව හඳුනාගෙන තිබේද යන්න ගැටලුවකි. පුවත්පතේ ප්‍රවෘත්ති වාර්තාකරණ ක්‍රියාවලිය හා සමාජ වගකිම ඉටුකිරීම සම්බන්ධයෙන් පවත්නා මතබේදකාරී තත්ත්වයන් ඊට හේතු වශයෙන් පෙන්වා දිය හැකිය. පොදුවේ ගත්කල ජන මාධ්‍යයන් වෙත පැවරුන පොදු සමාජමය වගකීම් සමුහයක් වෙයි. ඒ අතුරෙන් පුවත්පත වෙත පැවරුන සමාජ වගකීම පිළිබඳව අවධානය යොමු කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි.

මෙම අධ්‍යයනයේ ගැටලුව වශයෙන් පුවත්පත ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී සමාජ වගකීම ඉටු කරනවාද? යන්න ගොඩනගා ගත් අතර, **2003 සිදුවූ ඔරුගොඩවත්ත ළමා හිංසන සිද්ධිය සහ 1960 දශකයේ ලංකාව තුළ මහත් ආන්දෝලනයක් ඇති කළ කලත්තෑව සොයිසාගේ කතාව** යන තෝරා ගත් සිද්ධි දෙක ආශ්‍රයෙන් **දිවයින, දිනමිණ, ලංකාදීප, ජනතා, දවස,** වැනි පුවත්පත් වලට විශේෂිතව මෙම අධ්‍යයනය සිදු කරනු ලැබීය. මීට අමතරව සහභාගීත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා වැනි ක්‍රමවේදයන් ඔස්සේ මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය පසුබිම සකසා ගන්නා ලදී.

විශේෂයෙන් ම ජනමාධ්‍ය බහුලීකරණය නොවුන, පුවත්පත වැනි මාධ්‍යයන් ඉතාමත් ප්‍රබල ස්ථානයක පසුවූ 1960 වැනි යුගයක ආන්දෝලනාත්මක සහ තීරණාත්මක සිද්ධි සම්බන්ධයෙන් පුවත්පත් මාධ්‍ය ක්‍රියාකොට ඇති ආකාරය පිළිබඳ සොයා බැලීම සහ එම තත්ත්වයන් වර්තමාන දියුණු මාධ්‍ය ක්‍රියාකාරකම් සමඟ ගැලපීම මෙම අධ්‍යයනය ඔස්සේ සිදු කළේ ය. ඊට අමතරව පුවත්පත් ප්‍රවෘත්ති වාර්තාකරණයට පමණක් සීමා නොවී සෙසු කාර්යයන් පිළිබදව අවධානය යොමු කළ යුතු අතර වාර්තාකරණයේ දී මධ්‍යස්ථ බව, ස්වාධීන බව, සහ තර්කානුකූල බව, සම්බන්ධයෙන් පුවත්පත අවධානය යොමු කරනවා ද යන්න පිළිබඳව ද, ප්‍රවෘත්ති වාර්තාකරණය ඔස්සේ කලක දී ප්‍රවෘත්ති මැවූ ආන්දෝලනාත්මක සමාජ සිදුවීම් සම්බන්ධයෙන් නියමිත පසු විපරම් කාර්යය සිදු කරමින් නවතම තොරතුරු හෙළි කිරීමට පුවත්පත් ක්‍රියාකරනවා ද යන්න පිළිබඳව ද මෙම අධ්‍යයනය ඔස්සේ අවධානය යොමු කළේ ය.